Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාවය මත ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියට - (ජ්‍යෙෂ්ඨ කාලගුණ විද්‍යා නිලධාරි) උසස් කිරීම සඳහා වන අයදුම්පත් කැඳවීමේ නිවේදනය

1. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ 2012, 2014, 2015, 2016 හා 2017 වර්ෂවල ඇති වූ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා, පහත වගුවෙහි දක්වා ඇති තනතුරු පුරප්පාඩු ඇති වූ දිනයන්ට අදාළව මෙම නිවේදනයේ දක්වා ඇති අවම සුදුසුකම් සපුරාලන සේවයේ යෙදී සිටින හා විශ්‍රාමික (කාලගුණ විද්‍යා නිලධාරි/ නිරීක්ෂක/ සන්නිවේදකවරු) නිලධාරීන්ගෙන් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

| වර්ෂය | පුරප්පාඩු දිනය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 2012 | 2012.10.24 | 01 |
| 2014 | 2014.01.13 | 01 |
| | 2014.07.01 | 01 |
| | 2014.10.29 | 01 |
| 2015 | 2015.02.02 | 01 |
| | 2015.04.06 | 01 |
| | 2015.04.06 | 01 |
| | 2015.04.06 | 01 |
| | 2015.04.06 | 01 |
| 2016 | 2016.11.05 | 01 |
| 2017 | 2017.03.10 | 01 |

(මෙම තනතුරු පුරප්පාඩු සඳහා පුරප්පාඩු ඇති වූ දිනට අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.)

2. *අයදුම්පත් යොමු කිරීම* :

මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව සකස් කරන ලද අයදුම්පත්, අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය වන 2020.11.20 දිනය හෝ ඊට පෙර කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල්, 383, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුයි. කවරයේ වම්පස උඩ කෙලවරේ ''කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණය'' යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුයි.

3. *සුදුසුකම්* :

(අ) අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික (MN-03) සේවා ගණයේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර 06ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම හා නියමිත දිනට වැටුප් වර්ධක (06) ම උපයාගෙන තිබීම.

(ආ) උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(ඇ) අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර 06 ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

(ඈ) තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.

මෙම පුරප්පාඩු දැනට ප්‍රධාන කාර්යාලයෙහි සහ කටුනායක ගුවන්තොටුපල කාලගුණ විද්‍යා කාර්යාලයෙහි පවතින අතර ඉදිරියේ දී වෙනත් කාර්යාලයක වුව ද ඇති වීමට ඉඩ ඇත.

4. *බඳවා ගැනීමේ ක්‍රමය* :
ඉහත වගුවෙහි සඳහන් පුරප්පාඩු දිනයන්ට, 03 ඡේදයෙහි සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව හා අදාළ සෙසු අවශ්‍යතා ද සපුරා ඇති බවට තහවුරු කර ගැනීමෙන් අනතුරුව තනතුරු පුරප්පාඩු පුරවනු ලැබේ.

5. *තනතුරට අදාළ වැටුප් ක්‍රමය* :
   i. 2012, 2014 හා 2015 වර්ෂයන් සඳහා -
   රා. ප.ච. 06/2006 (iv) ට අනුව MN 7 2006 A -
   රු. 20,030-11 x 365-18 x 500-රු. 33,045

   ii. 2016 හා 2017 වර්ෂය සඳහා
   රා. ප.ච. 03/2016 ට අනුව MN 7 2016- රු. 41,580-11 x 755 - 18 x 1,030 - රු. 68,425

6. සහතික පත්‍ර හා ලියවිලි මගින් සම්මුඛ පරීක්ෂණයේදී සනාථ කරනු ලබන සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.

7. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම - (''ජ්‍යෙෂ්ඨ කාලගුණ විද්‍යා නිලධාරී'')

**ලකුණු ලබාදීමේ පටිපාටිය**

i. *සේවා කාලය* ලකුණු 50
ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ වසර 06ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව එළඹෙන එක් වර්ෂයක් සඳහා ලකුණු 2.5 බැගින් උපරිම ලකුණු 50

ii. *කුසලතාවය* ලකුණු 50

i. වෘත්තීය සුදුසුකම් ලකුණු 20

A. රැකියා ක්ෂේත්‍රයට අදළව ලබා ඇති
*a.* ලෝක කාලගුණ විද්‍යා සංවිධානයේ III වන පන්තියේ සහතික පත්‍රය සඳහා ලකුණු 10
*b.* ලෝක කාලගුණ විද්‍යා සංවිධානයේ IV වන පන්තියේ සහතික පත්‍රය සඳහා ලකුණු 05

B. දෙපාර්තමේන්තුව විසින් ලබාදී ඇති විදේශීය පුහුණුවීම් සඳහා

*a.* සාර්ථකව නිම කළ දින 30 හෝ ඊට වැඩි පාඨමාලා සහතික පත්‍රයක් සඳහා ලකුණු 05
*b.* සාර්ථකව නිම කළ දින 29-15 අතර පාඨමාලා සහතික පත්‍රයක් සඳහා ලකුණු 03
*c.* සාර්ථකව නිම කළ දින 14ට අඩු පාඨමාලා සහතික පත්‍රයක් සඳහා ලකුණු 01

ii. රැකියා ක්ෂේත්‍රයේ සේවාවන්ට අදළව ලබා ඇති පුහුණුව ලකුණු 20
*a.* රේඩාර් පුහුණුව ලකුණු 08

*b.* ජපන් සොන්ඩ් පුහුණුව ලකුණු 02
*c.* දෙපාර්තමේන්තුව ලබාදුන් අඛණ්ඩ පුහුණු පාඨමාලා එක් පුහුණුවකට ලකුණු 02 බැගින් ලකුණු 10

iii. භාෂා කුසලතාවය
ජාත්‍යන්තර භාෂාව ලකුණු 05

*a.* අ.පො.ස. (උ/පෙ) ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදරා සමත්ව තිබීම හෝ විශ්වවිද්‍යාල උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් සම්පූර්ණ කර තිබීම ලකුණු 05
*b.* විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ ආයතනයකින් හැදෑරූ මාස 06කට නොඅඩු ඉංග්‍රීසි ඩිප්ලෝමා සහතික පාඨමාලාව ලකුණු 05
*c.* විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ ආයතනයකින් හැදෑරූ මාස 06කට නොඅඩු ඉංග්‍රීසි සහතිකපත්‍ර පාඨමාලාව ලකුණු 05
*d.* අ.පො.ස. (උ/පෙ) විභාගය සඳහා ඉංග්‍රීසි විෂයයක් වශයෙන් හදරා සමත්ව තිබීම. ලකුණු 04
*e.* අ.පො.ස. (සා/පෙ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයයට විශිෂ්ඨ සාමාර්ථයක් ලබා තිබීම. ලකුණු 04
*f.* අ.පො.ස. (සා/පෙ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම ලකුණු 03
*g.* අ.පො.ස. (සා/පෙ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයය සමත් වීම ලකුණු 02

(ඉහළම එක් සුදුසුකමකට පමණක් ලකුණු ලබා දේ.)

iv. පරිගණක සාක්ෂරතාව ලකුණු 05

*a.* තෘතීක අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ලබාගත් පැය 720 කට නොඅඩු පරිගණක ඩිප්ලෝමා සහතිකය/සහතිකපත්‍ර පාඨමාලාව ලකුණු 05
*b.* තෘතීක අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ලබාගත් පැය 350 කට නොඅඩු පරිගණක සහතිකපත්‍ර පාඨමාලාව ලකුණු 04
*c.* දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරනු ලැබූ පරිගණක සහතිකපත්‍ර පාඨමාලා සහතිකය ලකුණු 03

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා
ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය.

දිනය : 2020 ඔක්තෝබර් මස 05 වැනි දින.

ආදර්ශ අයදුම්පත්‍රය

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාවය මත ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම - ''ජ්‍යෙෂ්ඨ කාලගුණ විද්‍යා නිලධාරි''

1. නිලධාරියාගේ නම :————.

2. ශ්‍රී. ලං. තා. සේ. I ශ්‍රේණියට පත් වූ දිනය :————.

3. පහත වගුවෙහි සඳහන් දිනවලට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ සේවා කාලය :

| දිනය | එම දිනට සේවා කාලය | | |
|---|---|---|---|
| | අවුරුදු | මාස | දින |
| 2012.10.24 | | | |
| 2014.01.13 | | | |
| 2014.07.01 | | | |
| 2014.10.29 | | | |
| 2015.02.02 | | | |
| 2015.04.06 | | | |
| 2015.04.06 | | | |
| 2015.04.06 | | | |
| 2015.04.06 | | | |
| 2016.11.05 | | | |
| 2017.03.10 | | | |

4. වෘත්තීය සුදුසුකම් :

| අනු. අංකය | පුහුණුව | ලබාගත් දිනය/සම්පූර්ණ කළ දිනය |
|---|---|---|
| 01 | ලෝක කාලගුණ විද්‍යා සංවිධානයේ III වන පන්තියේ සහතික පත්‍රය | |
| 02 | ලෝක කාලගුණ විද්‍යා සංවිධානයේ IV වන පන්තියේ සහතික පත්‍රය | |
| 03 | දෙපාර්තමේන්තුව විසින් ලබාදී ඇති විදේශීය පුහුණුවීම් | |
| 04 | වෙනත් වෘත්තීය සහතික | |

5. දෙපාර්තමේන්තුවෙන් ලබා ගන්නා ලද සියලුම පුහුණු පිළිබඳ විස්තර :

| අනු. අංකය | පුහුණුව | ආරම්භ කළ දිනය | අවසන් කළ දිනය |
|---|---|---|---|
| 01 | රේඩාර් පුහුණුව | | |
| 02 | දෙපාර්තමේන්තුව ලබාදුන් අඛණ්ඩ පුහුණුවීම් (CET) පාඨමාලා | | |
| 03 | වෙනත් පුහුණුවීම් | | |

6. භාෂා කුසලතාවය :

| අනු. අංකය | භාෂා කුසලතාවය | ලබාගත් දිනය/සම්පූර්ණ කළ දිනය |
|---|---|---|
| 01 | ජාත්‍යන්තර භාෂාව | |
| 02 | දෙවන භාෂාව | |

7. පරිගණක සාක්ෂරතාවය :

| අනු. අංකය | පුහුණුව | ආයතනය | ලබාගත් දිනය/ සම්පූර්ණ කළ දිනය |
|---|---|---|---|
| | | | |

8. ශ්‍රී. ලං. තා. සේ. විශේෂ ශ්‍රේණියේ උසස්වීම ලැබුණහොත් කොළඹ, මත්තල හා කටුනායක කාලගුණ විද්‍යා කාර්යාලවල සහ කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නම් කරන වෙනත් කාර්යාලයක සේවය කිරීමට මෙයින් මනාපය පළ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.